කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

පාලි - PALI - E1025

මූලාශ්‍රය පරිචය හා සාහිත්‍ය විචාරය

<u>1, 4 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි          කාලය : පැය 03 යි

---

01. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සකෙකා දෙවානමිනෙදා අහමෙව යුතතං ජානාමීති භයානකං මහනතං රකඛසවෙසං නිම්මිනිතවා තසසාවිදූරෙ තිගාවුතුබෙබධං අඤජනවණණං මහනතං පබබතං මාපෙතවා මහාරාජ ඉමමාරුයහ පබබතමුදධනිටඨිතො මම මුඛෙ පතතු, අහං පතනතසස තෙ ධමමං දෙසෙසසාමි, එවං සනෙත තුයහං ධමමපටිලාභො, මයහං ච මංසපටිලාභො භවිසසතීති ආහ.

අ) ඉහත ඡේදයේ සිංහල තේරුම ලියන්න.

ආ) ඉහත ඡේදය රෝමන් අකුරෙන් ලියන්න.

ඉ) එම ඡේදය නාගර අකුරෙන් ලියන්න.

02. එංගලන්තයේ පාලි මූලාශ්‍රය ග්‍රන්ථ ප්‍රකාශන සංගමය (P T S) විසින් සම්පාදිත පාලි ත්‍රිපිටක ග්‍රන්ථ හා ඒවායේ සම්පාදකයන් පිළිබඳ විස්තරයක් කරන්න.

03. බුරුම අක්ෂර මාලාව හා පාලි අක්ෂර මාලාව වෙන වෙනම ලියා ඒ දෙකෙහි දැකිය හැකි සම විෂමතා ගෙනහැර දක්වන්න.

04. අ) අට ගණය දක්වා සුභාසුභ ගණ නම් කරන්න.

ආ) පාලියේ ඡන්දස් හා අලංකාර ද්වි ප්‍රභේදය පැහැදිලි කරන්න.

05. සුබෝධාලංකාර කතුවරයා අලංකාරවලට වඩා ගුණ උසස් බව සිතීමේ යුක්තිය පහදා පද, වාක්‍ය හා අර්ථ දෝෂ නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

06. සංසරක්ඛිත හිමියන් බෞද්ධ කාව්‍ය විචාරය සඳහා ප්‍රාමාණික කොට සැලකූ ප්‍රධාන සිද්ධාන්ත පිළිබඳ විවරණයක් කරන්න.

07. කාව්‍යමය හා සාහිත්‍යමය ලක්‍ෂණ විසින් ඇගයිය හැකි නිකායාගත සූත්‍ර දේශනා පිළිබඳ විමසීමක් කරන්න.

08. පාලියෙන් රචනා වී ඇති සිලා ලිපි හා සන්දේශ පිළිබඳ විස්තරයක් කරන්න.

09. බෞද්ධ දෘෂ්ටිය අනුව ප්‍රතික්‍ෂෙප කළ යුත්තේ කවර ආකාරයේ නාට්‍ය නිර්මාණ දැයි නාට්‍ය පිළිබඳ බෞද්ධ ආකල්පය ඇසුරෙන් විමසන්න.

10. සම්භාව්‍ය සිංහල සාහිත්‍යය බෞද්ධ වස්තුබීජ ආශ්‍රයෙන් පෝෂණය වී ඇති ආකාරය නිදසුන් මගින් අනාවරණය කරන්න.

*************************